ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

අධ්‍යාපනයේ පදනම - **ESU 3212**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.08.26 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද දෙවන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යයන් තුන (03) නම් කරන්න.

02. සුදුසු නිදසුන් ඇසුරින් "අවිධිමත් ඉගෙනුම" නැමැති සංකල්පය විස්තර කරන්න.

03. "සිරස් සමාජ සචලතාව" හා "තිරස් සමාජ සචලතාව" අතර වෙනස දක්වන්න.

04. අධ්‍යාපන අරමුණු තීරණය කිරීමේ අවශ්‍යතාව සඳහා හේතු තුන (03) ක් ඉදිරිපත් කරන්න.

05. ශ්‍රී ලංකාවේ විවෘත දුරස්ථ අධ්‍යාපන ක්‍රමයේ වාසි තුන (03) ක් නම් කරන්න.

06. "අධ්‍යාපනය යෙදවුම්, නිමැවුම් හා ක්‍රියාවලිය සමඟ සලකා බැලිය හැකිය." ඉහත ප්‍රකාශය අගය කරන්න.

07. පාසල් යායුතු වයසේ ළමුන් අනිවාර්යයෙන්ම පාසල් යා යුත්තේ ඇයි ? හේතු දෙක (02) ක් ඉදිරිපත් කරන්න.

08. සංස්කෘතිය හා සමාජානුයෝගය අතර සම්බන්ධතාව විග්‍රහ කරන්න.

(ලකුණු 5 x 8 = 40)

LIBRARY

## 2 වන කොටස.

09. i. ළමයෙකුගේ පූර්ණ සංවර්ධනය යන සංකල්පයේ සැබෑ අර්ථය විස්තර කරන්න. (ලකුණු 05)

ii. මෙම සංකල්පය සංවර්ධනයේදී ජීන් ජැක් රූසෝ , ජෝන් ඩිවී හා මහත්මා ගාන්ධිගේ දර්ශනයේ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

10. i. "සාරධර්ම අධ්‍යාපනය" නිර්වචනය කරන්න. (ලකුණු 04)

ii. වර්තමාන ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් විෂයමාලාව තුළ සාරධර්ම අධ්‍යාපනය අවධාරණය කර ඇති ආකාරය විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 08)

iii. චරිත සංවර්ධන පුහුණුකරුවෙක් ලෙස ගුරුවරයාගේ භූමිකාව විස්තර කරන්න. (ලකුණු 08)

11. i. සමාජානුයෝගය සිදුවන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

ii. ළමයාගේ සමාජානුයෝගී ක්‍රියාවලියේදී පාසල තුළ හා ඉන් පිටතදී සමවයස් කණ්ඩායම්වල භූමිකාව විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 08)

iii. ඔබ පන්ති කාමරය තුළදී සමවයස් අන්තර්ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

12. i. පාසල හා සමාජය අතර සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ පාසල් සංවර්ධනය සඳහා සමාජීය දායකත්වය ලබාගත හැකි ආකාරය නිදසුන් දක්වමින් කෙටියෙන් සාකච්ඡා කරන්න (ලකුණු 12)

13. i. ශ්‍රී ලංකාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සමාජ පංතිය ළමුන්ගේ අධ්‍යාපන ප්‍රාප්තියට හේතුවන ආකාරය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

ii. සමාජ සචලතාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනය අදාළ කරගත හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 12)

14. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකකට අදහස් දක්වන්න.

i. සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපනය හා රැකියා අවස්ථා අතර ඇති අසමතුලිතතාවය.

ii. ජාතික ඒකාග්‍රතාව හා ජාතික එකමුතුකම වර්ධනය කිරීමේ ප්‍රධාන භූමිකාව ශ්‍රී ලංකාවේ පාසල් සතුය

iii. යාවජීව අධ්‍යාපනය යන සංකල්පයේ කේන්ද්‍රීයතාව ඉගෙනුම් සමාජය යන්නෙන් පිළිබිඹු වේ.

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -

LIBRARY UNIVERSITY OF SRI LANKA